# කෙලොන්න ප්‍රාදේශීය සභාව

## ජල සේවා සම්බන්ධතාවයන් පිළිබඳව පාරිභෝගිකයා විසින් බැඳෙන ගිවිසුම

........................................................................................................................................................ පදිංචි
......................................................................................................................... වන මම කොලොන්න ප්‍රාදේශීය සභාවේ ජල සැපයුම් ක්‍රමයන්හි පහත සඳහන් කරන කොන්දේසි වලට අනුකූලව පහත සඳහන් ජල සේවා සම්බන්ධතාවයන් ලබා ගැනීමට එකඟ වන්නෙමි.

ස්ථානයේ ලිපිනය ..........................................................................................................................................

1. 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 114 යටතේ හා තත්කාලීන අතුරු ව්‍යවස්ථාවන් ප්‍රකාරව පහත සඳහන් කොන්දේසි වලට හා පසුව සභාව විසින් පනවනු ලබන කවර කොන්දේසි වලට හෝ අනුකූල වීමටත් යම් හෙයින් එසේ හැඟවෙන කොන්දේසි හා බදුවලට අනුකූල වීමටත්, මා අසමත් වුවහොත් ප්‍රාදේශීය සභාවේ අභිමතය පරිදි කවර අවස්ථාවක වුවද මෙම සේවා සම්බන්ධනය විසන්දි කරනු ලැබීමට යටත් වන බවට සම්පූර්ණ දැනුම ඇතුව සිටීමත්,

2. පරිශ්‍රය වෙත ලබා ගන්නා ප්‍රධාන ජල සැපයුමෙන් මණ්ඩගත අතුරු සම්බන්ධනය වෙන වෙනම ඉල්ලා සිටින අවස්ථාවකදී නිශ්චිත කාල සීමාවක් තුළ ප්‍රධාන මාපකයේ සටහන් පරිභෝජනයේ එකතුව අතර ඌණතාවයන් පවතින්නේනම්, එහි පරිභෝජනය භෝජන ඌණතාවයන් අතුරු මාපකවල ගිණුම් වලට සමානුපාතිකව පදනමක් යටතේ ඇතුළත් කර එම ගාස්තු නිරවුල් කිරීමටත්, එම ගාස්තු ගෙවීම නිසා සිදු වන අවස්ථා අතුරු මාපක වලට අයත් හිඟ මුදල් නිරවුල් කර තිබුණද ප්‍රධාන සේවා සැපයුම විසන්ධි කරනු ලැබීමට යටත් වන බවට දැනුවත්ව සිටීමත්,

3. ජල සම්බන්ධනයක් ඉල්ලුම් කරන ස්ථානයට කොලොන්න ප්‍රාදේශීය සභාවේ අනුමැතිය නොමැතිව ජල සැපයුම ලබා ගැනීම නොකළ යුතු බවද කොලොන්න ප්‍රාදේශීය සභාවේ රෙගුලාසි මත ජල සැපයුම විසන්ධි කිරීමට හැකි බවද දැනුවත්ව සිටීමටත්,

4. සපයනු ලබන ජලය අපතේ නොයැවීම හා අයථා පරිදි පාවිච්චි නොකිරීමටත්, වග බලා ගැනීමටද,

5. කොලොන්න ප්‍රාදේශීය සභාවේ සභාපති විසින් බලය දෙන ලද කවර නිලධාරියෙකුට වුවද සියලු අභ්‍යන්තර ජලනල හා සවිකළ උපකරණ පරික්ෂා කර බැලීමට කවර සාධාරණ වේලාවක් වුවද ඉඩ පහසුකම් ලබා දීමටද,

6. කොලොන්න ප්‍රාදේශීය සභාවේ දේපළ වශයෙන් පවතින ජල මීටරය සඳහන් ඒකක ප්‍රමාණ අනුව ලේකම්ට ගෙවිය යුතු වන ජල ගාස්තුව ගෙවීමට එකඟ වන්නෙමි.
( ඉහත සඳහන්  සමහර රෙගුලාසි හා නියෝග වලට අන්තර්ගත කොන්දේසි වලට වඩා පැහැදිලි වන සේ මෙසේ පහත දක්වා ඇත. එහෙත් සම්පූර්ණමය නොවන අතර සාමාජිකයන්ගේ පහසුව සඳහා මෙසේ පහත දක්වා ඇත)

7. පාරිභෝගිකයා ජල සම්බන්ධකය ලබා දෙනු ලබන නල මාර්ගයට ජල මනුව දක්වා ජල මනුවද ඇතුළත්ව සියලු උපකරණ හා නල කොලොන්න ප්‍රාදේශීය සභාව සතු දේපළ වශයෙන් පවතින අතර, සභාවේ සේවකයන් හැර වෙනත් කිසිම අයෙකු විසින් කුමන හේතුවක් නිසා හෝ එම උපකරණ හෝ නල වලට හානි කිරීමක් නොකළ යුතුය.

8. පහත සඳහන් උපකරණ යා කළ හැකි වුවහොත්, නැත්නම් ඒවාට අලාභ හානි සිදුවුව හොත් පාරිභෝගිකයා ඒ බව කොලොන්න ප්‍රාදේශීය සභාවට දැනුම් දිය යුතු අතර එම අලාභහානිය උපකරණ දෝෂ සහිතව නිෂ්පාදන තත්වයේ හේතුවෙන් සිදුව ඇති අවස්ථාවලදී හැර එවැනි හානි වූ අලුත්වැඩියා කිරීමට හෝ නැවක සැපයීම සඳහා වන සියලු වියදම් පාරිභෝගිකයා කොලොන්න ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු අතර මේ සම්බන්ධව කොලොන්න ප්‍රාදේශීය සභාව විසින් ගනු ලපන තීරණය අවසන් තීරණය වේ.

9. යම්කිසි අවස්ථාවක දී ජල මනුව ක්‍රියා විරහිත වීමෙන් හෝ සටහන් ගැනීම සඳහා සභාවේ නියෝජිතයන්ට මනුව වෙත යාමට නොහැකි නම් අදාල කාලය තළ ඊට කලින් සටහන් වී ඇති පරිභෝජනය අනුසාරයෙන් හෝ වෙනත් සුදුසු ආකාරයකින් තක්සේරු කර ජල බිල්පත් ඔබ වෙත ඉදිරිපත් කරනු ලැබේ.

10. කොලොන්න ප්‍රාදේශීය සභාව සතු ජලනලයෙන් පසුව සවි කර ඇති සිසියම් ජලනලයක් හෝ උපකරණ නඩත්තු කිරීමේ වගකීම ප්‍රදේශීය සභාව භාරගනු නොලැබේ.

11. ජල සැපයුම සම්බන්ධ කාර්යයන් සඳහා කොලොන්න ප්‍රාදේශීය සභාවේ බලයලත් නිලධාරීන්ට පමණක් ජල සැපයුම පරීක්ෂා කිරීමට ඉඩ ලබාදිය යුතුය .

12. ප්‍රදේශයේ අනෙකුත් පාරිභෝගිකයන්ට කාර්යක්ෂම ලෙස ජලය සැපයීමට බාධා වන ලෙස අනිසි අයුරින් ජල සැපයුම භාවිතා කිරීම එනම් අදාළ ජල සැපයුම විසන්ධි කිරීමට ප්‍රාදේශීය සභාවට බලය ඇති අතර ඒ සඳහා ප්‍රාදේශීය සභාවේ ජලය බෙදා හැරීමේ පද්ධතියේ නිසි ක්‍රියාකාරීත්වයටසම්බන්ධ පරීක්ෂා කිරීමක් හෝ වෙනත් හදිසි අලුත්වැඩියා කටයුතු හෝ වෙනත් කිනම් හේතුවක කාර්යක් සඳහා ජල සැපයුම තාවකාලිකව නතර කිරීමට ප්‍රාදේශීය සභාව ඒ සඳහා වග කියනු නොලැබේ. හැකි සෑම අවස්ථාවකදීම ප්‍රාදේශීය සභාව පාරිභෝගිකයා වෙත කලින් දැනුම් දීමක් කරනු ඇත.

13 එක් එක් උප ක්‍රමයක් යටතේ තමාට ලබා දී ඇති ජල සැපයුම අධි අයකිරීම් ක්‍රමයක් ක්‍රියාත්මකව පවත්නා කවර හෝ කාර්යයක් සඳහා පාරිභෝගිකයා විසින් භාවිත නොකළ යුතුය. කිසියම් පාරිභෝගිකයකු එබඳු අධි අය ක්‍රමයට යටත් විය යුතු දිනයේ සිට එකී අය ක්‍රමය යටතේ ජල ගාස්තු ගෙවීමට පාරිභෝගිකයා බැඳී සිටිනු ඇත.

14 ජල සැපයුම සඳහා ගෙවිය යුතු මුදල අයපත් මගින් දන්වා එවනු ලැබූ විට සම්පූර්ණයෙන්ම නොගෙවුවහොත් මෙහි සඳහන් ජල සැපයුම පිළිබඳ කොන්දේසි කිසිවක් උල්ලංඝනය කරනු ලැබුවහොත් ජල සැපයුම සිඳලීමේ අයිතිය ප්‍රාදේශීය සභාව සතු වේ.

15 පාරිභෝගිකයා නිවාස හිමියා හෝ වෙනත් අයෙකු වුවද මෙයට අදාළ ජල සැපයුම නැවත ලබා දෙන්නේ නම් එය කිරීමට කටයුතු කරනු ලබන්නේ ඒ සඳහා වැය වන සියලු වියදම් හා හිඟ ගාස්තු සියල්ල පාරිභෝගිකයා විසින් ගෙවීමට කටයුතු කිරීමෙන් පසුව පමණි.

16 ජල මණු කියවීම සඳහා පැමිණෙන නිලධාරීන්ට මණු කියවීමට අදාළ පහසුකම් සලසා දිය යුතුය.

17 කොලොන්න ප්‍රාදේශීය සභාව විසින් තමාට සපයා ඇති ජල පාරිභෝගිකයා විසින් අනිසි අන්දමින් භාවිත කිරීමක් හෝ සපයා ඇති ජල සැපයුමටත් කොටසක් වෙනත් අයෙකුට සැපයීම හෝ විකිණීම දඬුවම් ලැබිය හැකි වරදකි. ජල සැපයුම සිඳලන දිනය දක්වා සපයනු ලබන ජලය සඳහා ගෙවීම් කිරීමට පාරිභෝගිකයාට සිදු වනු ඇත. සංශෝධනය හෝ වෙනස් කිරීමක් එකී දැනුම් දීමේ සඳහන් නියමිත දිනයේ සිට ක්‍රියාත්මක වනු ඇත.

18 ප්‍රසිද්ධ දැන්වීමක් මගින් හෝ පාරිභෝගිකයාට ලිඛිතව දැනුම්දීමෙන් පසු ජල සැපයුම පිළිබඳව ඉහත සඳහන් කොන්දේසි වලින් සමහරක් හෝ නැතහොත් අය ක්‍රමය යටතේ වූ ගාස්තුවකින් කලින් කලය

සංශෝධනය කිරීමට හෝ වෙනස් කිරීමට හෝ ප්‍රාදේශීය සභාවට හැකි වේ. එබඳු සංශෝධනයත් හෝ වෙනස් කිරීම් එහි දැනුම්දීමේදී සඳහන් නියමිත දිනයේදී ක්‍රියාත්මක වනු ඇත.

19 එම ජල සැපයුම වෙනස් කිරීමට තහවුරු කිරීමේ කටයුත්තක් සඳහා ................................ වන බව ඉහත සඳහන් කොනදේසි සියල්ල කියවා තේරුම්ගත් බවත් එම කරුණු සියල්ල වරින් වර පනවනු ලබන කවර හෝ කොන්දේසි වලට අනුකූලව ක්‍රියා කිරීමට එකඟ වන බවත් මෙයින් දන්වා සිටිමි.

20 සැපයුම සිඳලන දිනය දක්වා සපයනු ලබන ජලය සඳහා ගෙවීම් කිරීමට පාරිභෝගිකයාට සිදුවනු ඇත. එබඳු සංශෝධන හෝ වෙනස් කිරීම් එකී දැනුම් දීමේ සඳහන් නියමිත දිනයේ සිට ක්‍රියාත්මක වනු ඇත.

21 එම ජල සැපයුම ලබා ගැනීමට වෙනස් කිරීමට අයිතිය තහවුරු කිරීමේ කටයුත්තක් සඳහා ................................ වන බව ඉහත සඳහන් කොන්දේසි සියල්ල කියවා තේරුම්ගත් බවත් මෙයින් ඔබ වෙත දන්වා සිටිමි.

22 මීට පෙර මෙම තැපැල් අංකය සහා වරිපනම් අංකය භාවිතා කර ජල සම්බන්ධතාවයක් ලබා නොගත් බවට සහතික කරමි.

.........................................                                        ...........................................

පාරිභෝගිකයාගේ අත්සන                                        හැඳුනුම්පත් අංකය

20.................මස ........... දින වූ මෙදින මා ඉදිරියේ දිවුරුම් දෙන ලදී. ප්‍රතිඥා දෙන ලදී.

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

..............................................                                        ..........................................

බලයලත් නිලධාරියාගේ අත්සන                                        සභාපති

කොලොන්න ප්‍රාදේශීය සභාව

කාණ්ඩ අංකය - .......................................................

<u>කොලොන්න ජල යෝජනා ක්‍රමයෙන් ජලය ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය</u>

1. ඉල්ලුම්කරුගේ නම - ..........................................................................................
2. (අ) ලිපිනය - ..........................................................................................
   (ආ)දුරකථන අංකය - .............................................................

3. වරිපනම් අංකය (ඇත්නම්) - .............................................................
4. ජල සම්බන්ධය ලබා ගන්නා ස්ථානයේ සිට නිවසට දුර - ...............................................
5. පාර කැඩෙන්නේ නම්
   I. පාරේ ස්වභාවය(තාර/බොරළු) - .....................................................................
   II. පාරේ කැඩෙන ප්‍රමාණය (අඩි) - .. ...................................................................
   III. පාරේ උරහිස කැඩෙන ප්‍රමාණය - .........................................................................
6. පෙර ජලය ලබා ගෙන කපා හැර ඇත් ද (විස්තර කරන්න) ......................................................

.........................................................................................................................................................

7. ජල සැපයුම් ලබාගැනීමෙන් පසුව කොලොන්න ප්‍රාදේශීය සභාවට මේ සම්බන්ධව පනවන නීතිරීති වලට එකඟව කටයුතු කරමි.

............................................................. .....................................................

දිනය ඉල්ලුම්කරුගේ අත්සන

8. කාර්මික නිලධාරි

ජල සැපයුමක් ලබාදීම සුදුසු බව නිර්දේශ කරමි./ නොකරමි.

..................................................... .................................................

දිනය කාර්මික නිලධාරි

9. අනුමත කරමි./ නොකරමි

............................................ ............................................

දිනය ලේකම්

10. කාර්මික නිලධාරි නිර්දේශය

මෙම ඉල්ලීම අනුව ජලය ලබා ගැනීම නිර්දේශ කරමි. / නොකරමි. ඒ සඳහා ඇස්තමේන්තු මුදල පහත පරිදිය.

I. ................................................................ රු......................................................

II. ................................................................ රු......................................................

III. ................................................................ රු.....................................................

IV. ................................................................. රු.......................................................

V. ................................................................ රු.........................................................

VI. ................................................................. රු........................................................

මුළු වියදම

ඉහත ඇස්තමේන්තුවට අදාළ ගාස්තු අය කර ගෙන ජල සැපයුම ලබාදීම නිර්දේශ කරමි.

..........................................................

කාර්මික නිලධාරි

ජල සැපයුම ලබාදීම අනුමත කරමි./ නොකරමි.

ලේකම්,

කොලොන්න ප්‍රාදේශීය සභාව,

කොලොන්න.